**කොළඹ විශ්වවිද්‍යාලය**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී උපාධි දෙවන වසර (මාර්ගගත) පරීක්ෂණය**

**දෙවන සෙමෙස්තරය - 2019/2020**

**BST 2229 - උසස් පාලි භාෂාව**

**විවෘත ග්‍රන්ථ ලිඛිත පරීක්ෂණය**

- කාලයඃ පැය 24 ක් තුළ පිළිතුරු සම්පූර්ණ කොට පිළිතුරු පත්‍රය LMS වෙත උඩුගත කළ යුතුය.
- පළමුවන කොටසෙන් ප්‍රශ්න දෙකකට (02) ද දෙවන කොටසෙන් එක් ප්‍රශ්නයකට ද පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු (ලකුණු 20 බැගින්) හිමිවේ.
- එක් ප්‍රශ්නයකට ඔබගේ පිළිතුරු **වචන 1000කට** නොවැඩි විය යුතුය.

---

## I කොටස

01. (අ). සිංහලට පරිවර්තනය කරන්න.

අතීතෙ එකො යාචකො සචා'හං මූගං විය දස්සෙය්‍යං, බහුං මූලං ලභෙය්‍ය'න්ති චින්තෙත්වා "මූගො'ති වචනං එකස්මිං ඵලකෙ ලිඛාපෙත්වා තං ගීවාය ලග්ගෙත්වා මග්ගපස්සෙ අට්ඨාසි. තස්ස පච්චාමිත්තො අඤ්ඤො යාචකො ඉමස්ස සාඨෙය්‍යං පාකටං කරිස්සාමී'ති චින්තෙත්වා තස්ස'විදූරෙ නිසීදි. යදෙ'කො අනුකම්පකො පුරිසො තස්ස මූගපතිරූපකස්ස පඤ්චමූල්‍යං දාතුං සන්තිකමූගපාගමී. තදා සො වෙරී'මහාසය මා එතස්ස කිඤ්චි මූලං දෙහි, සඨො එසො. නෙ'සො මූගො'ති උග්ඝොසොසි. අථ සො සඨො කොපාවිට්ඨො 'මුසාවාදී' සබ්බදා'වහං මූගො අහොසිං. ඉදානිපි මූගො භවාමීති ආහ. තදා සො කාරුණිකො අත්ථෙ'කච්චෙ මූගා යෙ සල්ලපිතුමම්පි සක්කොන්තීති වදන්තො තතො අපගච්ඡි.

(ආ). (i). පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

01. අපි සැමදා බුදුන් සරණ යමු.
02. තෙරුන්වහන්සේ උදෑසන මලුව අමදිති.
03. මිත්‍රයාගේ පුතා පාසලෙහි උගන්වයි.
04. ළමයා බල්ලාට බත් දෙයි.
05. වෙළෙන්දෝ මාර්ගයෙහි බඩු විකුණති.
06. තොපි හෙට පන්සලට යන්නෙහු ?
07. රියදුරා මාර්ගයෙහි රථය පදවයි.
08. මිනිස්සු දුම්රියෙන් නගරයට යති.
09. තොපි සතුන් නො මරවු.

10. සිටුවරයා සිඟන්නාට බත් දෙයි.

02. (අ). සිංහලට නගන්න.

බොධිසත්තො'පි පබ්බජිත්වා තස්මිංයෙව පදෙසෙ අනුපියං නාම අම්බවනෙ සත්තාහං පබ්බජ්ජාසුඛෙන වීතිනාමෙත්වා එකදිවසෙනෙව තිංසයොජනමග්ගං පදසා ගන්ත්වා රාජගහං පාවිසි. පවිසිත්වාන සපදානං පිණ්ඩාය චරි. සකලනගරං බොධිසත්තස්ස රූපදස්සනෙන ධනපාලකෙන පවිට්ඨරාජගහං විය අසුරින්දෙන පවිට්ඨදෙවනගරං විය ච සංඛොභං අගමාසි. රාජපුරිසා ගන්ත්වා ''දෙව, එවරූපො නාම සත්තො නගරෙ පිණ්ඩාය චරති. ''දෙවො වා මනුස්සො වා නාගො වා සුපණ්ණො වා කො නාමෙසො'ති න ජානාමාති ආරොචෙසුං. රාජා පාසාදතලෙ ඨත්වා මහාපුරිසං දිස්වා අච්ඡරියබ්භුතජාතො පුරිසෙ ආණාපෙසි. ''ගච්ඡථ භණෙ වීමංසථ, සචෙ අමනුස්සො භවිස්සති. නගරා නික්කමෙත්වා අන්තරාධායිස්සති. සචෙ දෙවතා භවිස්සති. ආකාසෙන ගච්ඡිස්සති. සචෙ නාගො භවිස්සති පඨවියං නිමුජ්ජිත්වා ගමිස්සති. සචෙ මනුස්සො භවිස්සති. යථාලද්ධං භික්ඛං පරිභුඤ්ජිස්සතී'ති

(ආ). පහත සඳහන් පාලි ගාථා සිංහලට පරිවර්තනය කරන්න

(i). ඉධ සොචති පෙච්ච සොචති - පාපකාරී උභයත්ථ සොචති
සො සොචති සො විහඤ්ඤති - දිස්වා කම්මකිලිට්ඨමත්තනො.

(ii). පුත්තා මත්ථි ධනම්මත්ථි - ඉති බාලො විහඤ්ඤති
අත්තාහි අත්තනො නත්ථි - කුතො පුත්තා කුතො ධනං ?

(iii). මධුවා මඤ්ඤතී බාලො - යාව පාපං න පච්චති
යදා ච පච්චතී පාපං - අථ බාලො දුක්ඛං නිගච්ඡති.

(iv). න භජෙ පාපකෙ මිත්තෙ - න භජෙ පුරිසාධමෙ
භජෙථ මිත්තෙ කල්‍යාණෙ - භජෙථ පුරිසුත්තමෙ.

(v). නත්ථි රාගසමො අග්ගි - නත්ථි දොසසමො කලි
නත්ථි ඛන්ධසමා දුක්ඛා - නත්ථි සන්ති පරං සුඛං.

03. (අ). සිංහලට නගන්න.

(i) යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ,
තෙසඤ්ච යො නිරොධො එවං වාදී මහාසමණො.

(ii) සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියොදපනං එතං බුද්ධානසාසනං.

(iv) ඡන්දා දොසා භයා මොහා යො ධම්මං නාතිවත්තති,

ආපූරතී තස්ස යසො සුක්ඛපක්ඛෙව චන්දිමා.

(v) ඉමිනා පුඤ්ඤකම්මෙන මා මෙ බාලසමාගමො,

සතං සමාගමො හොතු යාව නිබ්බානපත්තියා.

03. (ආ). පහත සඳහන් පාලි වාක්‍යය සිංහලට පරිවර්තනය කරන්න.

01. අහං මය්හං පුත්තස්ස අස්සං අදදිං.

02. මයං භූපතිනො අස්සෙ පස්සාම.

03. මම පුත්තා සෙට්ඨිනො ගාමෙ වසන්ති.

04. අම්හාකං මන්තිනො බලිනො අභවිංසු.

05. බන්ධවො සුසුහි සද්ධිං අම්හාකං ගෙහං ආගමිස්සන්ති.

06. මයං පිතරා සද්ධිං වෙළුවො ආහරිස්සාම.

07. භගවා අජ්ජ සොතාරානං ධම්මං දෙසෙස්සති.

08. යාව තව කඤ්ඤා ආගමිස්සති තාව ඉධ තිට්ඨාහි.

09.නාරියො ඔදනං පචිත්වා භුඤ්ජිත්වා කුක්කුටීනම්පි අදංසු.

10. අම්හාකං මාතරානං ගාවියො සබ්බත්ථ චරිත්වා රත්තියා ආගමිස්සන්ති.

## II කොටස

04. (අ). පාලි අක්ෂර මාලාව ලියා දක්වන්න.

(ආ). එහි දැකිය හැකි ප්‍රභේද දක්වා උප්පත්ති ස්ථාන අනුව අක්ෂර වර්ග කරන්න.

05. (අ). නර ශබ්දය සියලු විභක්තීන්හි වරනගන්න.

(ආ). ලිඛ ධාතුව වර්තමාන, අතීත කාලකත්තරි පරස්ස පදයෙහි වරනගන්න.

*************************